වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 294

පටුන

වගු ලැයිස්තුව IV
ප්‍රස්තාර ලැයිස්තුව V
රූප සටහන් ලැයිස්තුව V

01. පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 1
1.3 ප්‍රධාන කාර්යයන් 2
1.4 සංවිධාන සටහන 2
1.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 4
1.5.2 **2021.12.31** වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය 8
1.5.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය 8
1.5.4 **2021.12.31** වන දිනට සත්ත්ව එකතුව 9
1.5.5 දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම 10
1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන හා එහි කාර්යයන් 10
1.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය 10
1.6.2 පින්නවල අලි අනාථාගාරය 13
1.6.3 පින්නවල සත්වෝද්‍යානය 15
1.6.4 රිදියගම සෆාරි උද්‍යානය 18
1.6.5 ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ 21
1.7 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 22
1.7.1 රජයේ ඒකාබද්ධ අරමුදල 22
1.7.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල 24

02. පරිච්ඡේදය 25

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 25

03. පරිච්ඡේදය 27

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 27

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 27
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 28
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 29
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 31
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 32

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 32
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..... 32
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 32
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 32
04. පරිච්ඡේදය 33

කාර්ය සාධන දර්ශක..... 33

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)..... 33
05. පරිච්ඡේදය 35

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය..... 35

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු..... 35
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහන හා අභියෝග 36
06 පරිච්ඡේදය 37

මානව සම්පත් පැතිකඩ..... 37

5.3 සේවක සංඛ්‍යා කළමනාකරණය..... 37
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම. 37
6.3 මානව සම්පත් සංවර්ධනය 37
07 පරිච්ඡේදය 39

අනුකූලතා වාර්තාව..... 39

වගු ලැයිස්තුව

වගු සටහන 1.1	2021 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)	4
වගු සටහන 1.2	දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම	5
වගු සටහන 1.3	2020 – 2021 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම	5
වගු සටහන 1.4	2010 වසරේ සිට 2021 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම	7
වගු සටහන 1.5	2021.12.31 දිනට ප්‍රතිනිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)	8
වගු සටහන 1.6	2021.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය	8
වගු සටහන 1.7	2021.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන කටයුතු වල මූල්‍ය ප්‍රගති සාරාංශය	8
වගු සටහන 1.8	2021.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රගතිය	9
වගු සටහන 1.9	2021.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව	9
වගු සටහන 1.10	2021.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව	10
වගු සටහන 1.11	2021.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	10
වගු සටහන 1.12	2021.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	11
වගු සටහන 1.13	2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	11
වගු සටහන 1.14	2021.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව	13
වගු සටහන 1.15	2021.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	13
වගු සටහන 1.16	2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	13
වගු සටහන 1.17	2021.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	14
වගු සටහන 1.18	2021.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව	16
වගු සටහන 1.19	2021.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	16
වගු සටහන 1.20	2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	16
වගු සටහන 1.21	2021.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	16
වගු සටහන 1.22	2021.12.31 දිනට හම්බන්තොට සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව	18
වගු සටහන 1.23	2021.12.31 දිනට හම්බන්තොට සෆාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	18
වගු සටහන 1.24	2021.12.31 දිනට හම්බන්තොට සෆාරි උද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	18
වගු සටහන 1.25	2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	19
වගු සටහන 1.26	2021.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව	21
වගු සටහන 1.27	2021.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	21
වගු සටහන 1.28	වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල	22
වගු සටහන 1.29	වියදම් තොරතුරු - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.	24
වගු සටහන 3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	27
වගු සටහන 3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	28
වගු සටහන 3.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	29

වගු සටහන 3.4	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	32
වගු සටහන 3.5	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	32
වගු සටහන 3.6	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	32
වගු සටහන 4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	33
වගු සටහන 5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	34
වගු සටහන 6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	36
වගු සටහන 7.1	අනුකූලතා වාර්තාව	37

ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාර සටහන 1.1	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන	3
ප්‍රස්තාර සටහන 1.2	2021 වසරේ සංචාරකයින්ගේ පැමිණීම	6
ප්‍රස්තාර සටහන 1.3	2021 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම	6
ප්‍රස්තාර සටහන 1.4	2010 - 2021 දක්වා සංචාරක පැමිණීම	7
ප්‍රස්තාර සටහන 1.5	2010 - 2021 දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.	7

රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1.1	හිපෝ අරණ	12
රූප සටහන 1.2	හිපෝ අරණ අප ජලය පිරිපහදු කිරීම් ඒකක	12
රූප සටහන 1.3	මුළුතැන්ගෙය	12
රූප සටහන 1.4	සත්ත්ව රෝහල	12
රූප සටහන 1.5	සිංහ අරණ අලුත්වැඩියා කිරීම	12
රූප සටහන 1.6	මැකෝ ගිරවුන් සඳහා අරණ	12
රූප සටහන 1.7	අලි මඩු ඉදිකිරීම	14
රූප සටහන 1.8	නරඹන්නන් සඳහා වූ වැසිකිළි	14
රූප සටහන 1.9	හදිසි අවස්ථාවක දී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැට	15
රූප සටහන 1.10	විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු	15
රූප සටහන 1.11	ප්‍රවේශ ගොඩනැගිල්ලේ වහලය සහ අනෙකුත් අලුත්වැඩියා කටයුතු	15
රූප සටහන 1.12	අභ්‍යන්තර මාර්ග පද්ධතිය අලුත්වැඩියා කටයුතු	17
රූප සටහන 1.13	කබල්ලෑවා සඳහා වූ අරණ	17
රූප සටහන 1.14	වදුරු දූපත අදියර III	17
රූප සටහන 1.15	නිදහස් කුරුළු අරණ පෙදෙසෙහි වේන්ලින් සහ විදුලි වැට	17
රූප සටහන 1.16	අලින් හය දෙනෙකු සඳහා වූ අරණ	20
රූප සටහන 1.17	විදේශීය කුරුළු අරණ	20
රූප සටහන 1.18	සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථාන	20
රූප සටහන 1.19	සුරතල් සත්ත්ව කලාපය	20
රූප සටහන 1.20	ආසියානු අලි කලාපය සහ වීටා කලාපය අතර අඩි 16 උස වේන් ලිනක් වැට	20
රූප සටහන 1.21	සිංහ ගුහාව - අංක 03	20

01.පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජර්මන් ජාතික ජෝන් හාර්ගෙන්බෙක් මහතා විසින් වර්ෂ 1905 දී පමණ වනගත අලි ඇතුන් අල්ලා ජර්මනියේ පිහිටි හැම්බර්ග් නගරයට අපනයනය කිරීමට පෙර, රඳවා තබා ගැනීම සඳහා යොදා ගනු ලබන ස්ථානයක් ලෙස වර්තමාන ජාතික සත්වෝද්‍යානය පිහිටි භූමියෙන් අක්කර 5ක් මිලදී ගෙන ආරම්භ කරන ලදී. කාලයත් සමඟ සත්වගාලෙහි රඳවා සිටින අලි - ඇතුන් හා වෙනත් සත්ත්ව විශේෂ නැරඹීම සඳහා දිනෙන් දින නන්දෙසින් පැමිණෙන අතිවිශාල ජනතාව හේතුවෙන් තවදුරටත් අක්කර 11 ක භූමි භාගයක ව්‍යාප්ත කරමින් වර්ෂ 1926 දී “Ceylon Zoological Gardens Company” (ලංකා සත්ත්ව උද්‍යාන සමාගම) ලෙස නම් කරන ලදී.

බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ලංකා සත්ත්ව උද්‍යානය අක්කර 23ක භූමි භාගයක ව්‍යාප්ත කළ අතර, මෙරට නිදහස ලබා වර්ෂ 1946 දී ස්වාධීන රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කර 1962 දී ලංකා ආණ්ඩුව මඟින් ලංකා සත්ත්ව උද්‍යානය “ජාතික සත්ත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව” ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව, වර්ෂ 1936 ජූලි 03 වන දින රජයට පවරා ගන්නා ලද ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පාලනය සහ කළමනාකරණය කිරීමේ කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන යටතට පත් කරන ලදී.

පසුව, 70 දශකය වන විට දකුණු ආසියාවේ විශිෂ්ඨතම සත්ත්ව උද්‍යානය බවට පත් වූ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වර්තමානය වන විට දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය, රිදියගම සෆාරි උද්‍යානය හා ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ යන ආයතන දෙපාර්තමේන්තු පාලනය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

“ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම.”

මෙහෙවර

“නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීතිවලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම.”

අරමුණු

- සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය
- සත්ත්ව සුබසාධනය
- අධ්‍යාපනය
- පර්යේෂණ
- ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය ලබා දීම

1.3 ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් කාර්යයන්හි නියැලෙමින් ආයතනික අරමුණු ළඟා කරගැනීමට කටයුතු කරනු ලබයි.

- ස්වාභාවික තත්ත්වයට ආසන්න වාසභූමියක් තුළ විවිධත්වයෙන් යුතු දේශීය හා විදේශීය සත්ත්ව එකතුවක් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර සංගම් සහ සත්වෝද්‍යාන ජාලය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගීවීම සහ සබඳතා ඇතිකරගැනීම සහ සත්ත්ව හුවමාරු වැඩසටහන්වලට සහභාගීවීම.
- තර්ජනයට ලක්ව ඇති, වඳ වීමට ලක්ව ඇති සහ රටේ ආවේණික සත්ත්ව විශේෂයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් වන සත්ත්ව විශේෂයන්ගේ පරිභාහිර සංරක්ෂණය සහතික කිරීම.
- සත්ත්වයන් සහ අනෙකුත් සත්වෝද්‍යාන ශික්ෂණයන් පිළිබඳ වූ දැනුම පුළුල් කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.
- සතුන්ගේ ජීවන ක්‍රියාවලියට අවම බාධාවන් වන අයුරින්, දැනුම වර්ධනය කිරීමට සහ විනෝදාශ්වාදය ලබාදීම සඳහා සතුන් ප්‍රදර්ශනය කිරීම.
- පාරිසරික සංචරණය ප්‍රවර්ධනය කරමින් සහ ප්‍රදර්ශනය කිරීමේ නවීන සංකල්ප මඟින් සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා ඉටුකිරීම.
- පාසල් දරුවන්ගේ අවධිමත් අධ්‍යාපනය සඳහා සහයවීමක් වශයෙන් දුරස්ථ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.
- පොදු ජනතාව සමඟ සහ පාසල් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් අධ්‍යාපනික වැඩසටහන් දියත් කිරීම.
- සත්වෝද්‍යාන වෙත ලැදියාවක් දක්වන විශේෂ සංවිධාන, දේශීය සහ විදේශීය ස්වේච්ඡා සේවකයන්, ශිෂ්‍යයින් සහ වැඩ කිරීමට ලැදියාවක් දක්වන කණ්ඩායම් දිරිමත් කිරීම.
- ශාක භක්ෂක සතුන් සඳහා ආහාර සැපයීමේ ගෝනපොල ගොවිපොළ, ශ්‍රවණාගාර, සත්ත්ව රෝහල්, වෙන් වෙන් වශයෙන් පිහිටවූ සේවා ඒකක, කෞතුකාගාර සහ පුස්තකාල වැනි උපකාරක සේවා සංවර්ධනය කිරීම.
- සත්වෝද්‍යාන තුළ අඛණ්ඩ නඩත්තු කිරීම් සහ සේවකයන් සඳහා ශ්‍රේණිය/සේවා උසස් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.

1.4 සංවිධාන සටහන

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයට අදාළ සංවිධාන සටහන පිටු අංක 03 හි දැක්වේ.

ප්‍රස්තාර සටහන 1.1

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



මූලාශ්‍රය 1.1 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය දෙහිවල සත්ත්ව උද්‍යාන පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර, දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ හම්බන්තොට සෆාරී උද්‍යානය මෙන්ම ගෝනපොළ ගොවිපළ යන ප්‍රධාන මෙහෙයුම් ඒකක 05 මේ යටතේ ක්‍රියාත්මක වේ. සත්ත්ව ප්‍රදර්ශන කටයුතු සිදු කිරීමත්, එතුළින් උපයා ගනු ලබන ප්‍රවේශපත්‍ර ආදායම සහ අනෙකුත් ආදායම් ඇතුළුව 2021 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම රු.මි. 109.57ක් ලෙස වාර්තා විය (වගු සටහන 1.1 සහ 1.2).

1.5.1 2021.12.31 දිනට සංචාරක පැමිණීම සහ ආදායම

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ආරම්භ කර වසර 85 සැපිරෙන තෙක්ම සත්ත්ව උද්‍යාන මහජනතාව වෙනුවෙන් සෑම දිනකම විවෘතව තැබූ ආයතනයක් විය. එසේ වුවද, ලොව පුරා ව්‍යාප්ත වූ කෝවිඩ් 19 වසන්ගත තත්ත්වය හේතුවෙන් රජයේ විධි විධානවලට අනුව දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන 2021 වර්ෂයේ ජනවාරි සහ ජුනි මාසයන්හි මහජනයා වෙනුවෙන් වසා දැමීමට සිදු විය. ඒ අනුව, 2021 වසරේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරකයින්ගේ පැමිණීම හා එම වසරේ ප්‍රවේශපත්‍ර ආදායම වගු සටහන 1.1 හා 1.2 මඟින් පෙන්නුම් කෙරේ.

වගු සටහන 1.1
2021 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)

මාසය	සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
ජනවාරි	0	0	0	0	0	0.37	0.37
පෙබරවාරි	53,825	296	54,121	6.99	0.83	0.35	8.17
මාර්තු	82,439	556	82,995	10.93	1.54	1.77	14.24
අප්‍රේල්	102,787	371	103,158	15.93	0.98	1.60	18.51
මැයි	645	8	653	0.09	0.02	0.09	0.2
ජුනි	0	0	0	0	0	0	0
ජූලි	6,447	60	6,507	0.69	0.12	0.85	1.66
අගෝස්තු	7,452	206	7,658	0.92	0.47	0.56	1.95
සැප්තැම්බර්	13	237	250	0	0.48	0	0.48
ඔක්තෝබර්	45,186	999	46,185	5.13	1.69	0.79	7.61
නොවැම්බර්	67,519	3,656	71,175	8.57	6.36	3.73	18.66
දෙසැම්බර්	164,564	7,388	171,952	20.49	12.80	4.43	37.72
එකතුව	**530,877**	**13,777**	**544,654**	**69.75**	**25.28**	**14.54**	**109.57**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.2 දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම - 2021								
ආයතනය/ ජාතික උද්‍යානය		සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			
		දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
1	දෙහිවල සත්වෝද්‍යානය	266,852	1,603	268,455	25.24	2.71	8.44	36.39
2	පින්නවල අලි අනාථාගාරය	92,003	11,555	103,558	8.71	21.58	0.17	30.45
3	පින්නවල සත්වෝද්‍යානය	82,037	324	82,361	7.95	0.23	3.35	11.53
4	රිදියගම සෆාරි උද්‍යානය	89,985	295	90,280	27.86	0.76	2.58	31.19
එකතුව		**530,877**	**13,777**	**544,654**	**69.75**	**25.28**	**14.54**	**109.57**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පහත වගු සටහන 1.3 අනුව, 2020 වර්ෂයේ සහ 2021 වර්ෂයේ සමස්ත සංචාරක පැමිණීම හා ආදායම මාසික වශයෙන් සංසන්ධනය කිරීමක් සිදු කර ඇත. ඒ අනුව, 2020 වර්ෂය සමඟ සැසඳීමේ දී 2021 වර්ෂයේ දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම සියයට 50 කට ආසන්න මට්ටමකින් පහළ බැසීමක් සිදු වී ඇත. ලොව පුරා ව්‍යාප්ත වූ කෝරෝනා වසංගත තත්ත්වය මත දෙස් විදෙස් සංචාරකයින්ගේ සංක්‍රමණයන් සීමා කිරීම, සත්ත්ව සුබසාධනය සුරක්ෂිත කිරීම ආදී කරුණු හේතුවෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන මහජනතාව සඳහා වසා දැමීමක් සිදු කරන ලදී.

වගු සටහන 1.3 2020 – 2021 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)				
මාසය	සංචාරක පැමිණීම		ආදායම (රු.මි.)	
	2020	2021	2020	2021
ජනවාරි	153,778	0	79.68	0.37
පෙබරවාරි	157,303	54,121	59.65	8.17
මාර්තු	87,920	82,995	23.76	14.24
අප්‍රේල්	0	103,158	0	18.51
මැයි	0	653	0	0.2
ජූනි	34,574	0	5.04	0
ජූලි	56,218	6,507	8.09	1.66
අගෝස්තු	75,183	7,658	10.59	1.95
සැප්තැම්බර්	81,941	250	11.86	0.48
ඔක්තෝබර්	36,781	46,185	5.16	7.61
නොවැම්බර්	0	71,175	0.84	18.66
දෙසැම්බර්	0	171,952	0.06	37.72
එකතුව	**683,698**	**544,654**	**204.73**	**109.57**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.2 : 2021 වසරේ සංචාරකයින්ගේ පැමිණීම (මාසිකව)



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.3 : 2021 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම (මාසිකව)



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ඉහත 1.2 සහ 1.3 ප්‍රස්තාර සටහනට අනුව ජනවාරි සහ ජූනි යන මාසවල සංචාරක පැමිණීම සහ ආදායම වාර්තා වීමක් සිදු නොවීය (දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම සංචාරක පැමිණීම මත තීරණය වන බැවින් කොවිඩ් වසංගත තත්ත්වය හේතුකොටගෙන මහජනතාව වෙනුවෙන් සත්වෝද්‍යාන විවෘත නොකිරීම මේ සඳහා ප්‍රධාන ලෙස බලපා ඇත).

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 11 ක පමණ සමස්ත සංචාරක පැමිණීම හා ආදායම පිළිබඳ විශ්ලේෂණයක් පහත වගු සටහන 1.4 මගින් දක්වා ඇත. ඒ අනුව, 2010 වසරට සාපේක්ෂව 2018 වසර දක්වා සමස්ත සංචාරකයින්ගේ පැමිණීම හා ආදායම ක්‍රමක් ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. ඒ වන විට මෙරට පැවති සාමකාමී වාතාවරණය හේතු වී ඇති බව පෙනී යනු ඇත. නමුත් පසුව, 2019 වසරේ පාස්කු ප්‍රහාරයත් 2020 වසරේ සිට 2021 වන තෙක් පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන සමස්ථ ආදායම රු. මි. 109.57දක්වා විශාල ලෙස පහළ යාමක් වාර්තා කරන ලදී.

වගු සටහන 1.4 2010 වසරේ සිට 2021 වර්ෂය දක්වා සංචාරක පැමිණීම සහ ආදායම		
වර්ෂය	සංචාරක පැමිණීම	ආදායම (රු.මි.)
2010	2,324,360	587.74
2011	2,438,635	651.38
2012	2,196,704	645.29
2013	2,172,810	719.87
2014	2,042,887	906.50
2015	2,781,380	1,034.87
2016	2,959,737	1,097.66
2017	2,885,955	998.62
2018	3,097,341	1006.42
2019	2,443,028	766.13
2020	683,698	204.73
2021	544,654	109.57

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.4 : 2010 - 2021 වර්ෂය දක්වා සංචාරක පැමිණීම



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.5 : 2010 - 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ඉහත ප්‍රස්තාර සටහනට 1.4 සහ 1.5 ට අනුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම හා ප්‍රවේශපත්‍ර ආදායම 2010 වසරේ සිට 2018 දක්වා ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරනු ලබන අතර, 2018 වසරින් පසු පහළ යාමක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, 2021 වසරේදී එහි කැපී පෙනෙන පහළ යාමක් පෙන්නුම් කිරීමට පෙර සඳහන් කළ පරිදී කෝවිඩ් 19 වසන්ගත තත්ත්වය ප්‍රධාන හෙතුවක් වී ඇත.

1.5.2 2021.12.31 වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

වගු සටහන 1.5
2021.12.31 දිනට ප්‍රතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)

වියදම් කාණ්ඩය	2021 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2021.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	720.8	293.80	41
පුනරාවර්තන වියදම්	566.0	526.35	93
එකතුව	**1286.8**	**820.15**	**64**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.6
2021.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය (සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල)

වියදම් කාණ්ඩය	2021 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2021.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	88.02	16.32	19
පුනරාවර්තන වියදම්	661.53	491.74	74
එකතුව	**749.55**	**508.06**	**68**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.5.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත වගු සටහන 1.7 මඟින් දක්වා ඇත.

වගු සටහන 1.7
2021.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම	07.80	07.19	92
2	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	80.00	11.84	15
3	මානව සම්පත් සංවර්ධනය	1.00	0.48	48
4	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය (1)	240.00	86.18	36
5	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය (2)	130.00	62.61	48
6	පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය (3)	150.00	30.10	20
7	රිදියගම සඟාරි උද්‍යානය සංවර්ධනය (4)	112.00	95.40	85
	එකතුව	**720.80**	**293.80**	**41**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.8
2021.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය	15.00	4.20	28
2	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය	25.00	7.15	29
3	පින්නවල සත්වෝද්‍යානය	05.00	3.59	26
4	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය	16.00	0	0
5	නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම	10.00	1.38	14
6	සතුන් මිල දී ගැනීම	0.01	0	0
7	වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	4.00	0	0
8	සතුන් අත්පත් කර ගැනීම සඳහා දරනු ලබන වියදම්	0.01	0	0
	එකතුව	**75.02**	**16.32**	**22**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.5.4 2021.12.31 වන දිනට සත්ත්ව එකතුව

වගු සටහන 1.9
2021.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින්ගේ ප්‍රමාණය
දෙහිවල ජාතික සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	56	264
2	පක්ෂි	71	781
3	උරග	36	161
4	මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන්	71	3131
5	උභය ජීවීන්	3	6
	එකතුව	**237**	**4343**
පින්නවල අලි අනාථාගාරය			
1	ක්ෂීරපායි - ආසියානු අලි	1	76
	එකතුව	**1**	**76**
පින්නවල සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	14	152
2	පක්ෂි	8	49
3	උරග	3	8
	එකතුව	**25**	**209**
හම්බන්තොට සෆාරි උද්‍යානය			
1	ක්ෂීරපායි	34	396
2	පක්ෂි	33	176
3	උරග	02	346
	එකතුව	**69**	**918**
ගෝනපොල උද්‍යානය			
1	ක්ෂීරපායි	1	2
2	පක්ෂි	7	24
3	උරග (ඉබ්බන්)	1	113
	එකතුව	**9**	**139**
2021.12.31 දිනට මුළු සත්ත්ව විශේෂ සංඛ්‍යාව හා එකතුව		**244**	**5685**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.5.5 දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ සේවක පරිපාලනය මෙන්ම සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබාගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමඟ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මේ මගින් දෙපාර්තමේන්තුවේ සත්ත්ව විශේෂ සංඛ්‍යාව ඉහළ නැංවීම, නව ජාන එකතු කිරීම තුළින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

ලොව පුරා ව්‍යාප්තවූ කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ගුවන් ප්‍රවාහනයන් සීමා කිරීම මත සත්ත්ව හුවමාරු වැඩසටහන් සිදු කිරීම තාවකාලිකව නවතා දමන ලදී. ඒ අනුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේදී ජාත්‍යන්තර වශයෙන් කිසිදු සත්ත්ව හුවමාරු වැඩසටහනක් සහ සතුන් මිලදී ගැනීම් කටයුත්තක් සිදු කර නොමැත.

1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන හා එහි කාර්යයන්

1.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

1920 දශකයේ පෙර භාගයේ දී ජර්මන් ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස අක්කර 11ක භූමි භාගයක් සහිත ව සංවර්ධනය කරන ලද දෙහිවල ජාතික සත්වෝද්‍යානය 1936 වර්ෂයේ දී රජයට පවරා ගන්නා ලද අතර මේ වන විට අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇත. දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විත අධ්‍යාපනික වටිනාකමකින් යුත් සත්ත්ව එකතුවක් දෙහිවල සත්වෝද්‍යානය තුළ පවති.

වර්තමානය වන විට සත්වෝද්‍යානයට නවීන සංකල්ප වලට ගැලපෙන පරිදි සත්ත්ව අරණවල් නවීකරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඒ අතර, සිංහ අරණ හා මුව අරණ අළුත්වැඩියා කිරීම, මැකෝ ගිරවුන් සඳහා නව අරණක් ඉදිකිරීම, හිපෝ අරණ නැවත ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති. ඒ අතර, හිපෝ අරණෙහි අප ජලය පිරිපහදු කිරීමේ ඒකකය ස්ථාපිත කිරීම, සත්ත්ව රෝහල නිර්මාණය සහ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

වගු සටහන **1.10**
2021.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී	56	264
2	පක්ෂි	71	781
3	උරග	36	161
4	මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන්	71	3131
5	උභය ජීවීන්	3	6
එකතුව		**237**	**4343**

මූලාශ්‍රය : දෙහිවල සත්වෝද්‍යාන

වගු සටහන **1.11**
2021.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී	13	52
2	පක්ෂි	17	85
3	උරග	2	24
4	මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන්	4	230
එකතුව		**36**	**391**

මූලාශ්‍රය : දෙහිවල සත්වෝද්‍යාන

වගු සටහන 1.12 2021.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය			
අරමුදල	**2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මි)**	**2021 සඳහා සත්‍ය වියදම(රු.මි)**	**මූල්‍ය ප්‍රගතිය %**
රජයේ ඒකාබද්ධ අරමුදල	240	86.18	36
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	15	4.20	28
එකතුව	**255**	**90.38**	**35**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.13 2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්			
අනු අංකය	**වැඩසටහන්**	**ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම**	**ක්‍රියාකාරකම් ප්‍රමාණය**
01	දේශන හා ප්‍රායෝගික වැඩමුළු	විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන පැවැත්වීම.	03
		විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන පැවැත්වීම (Online තාක්ෂණය මගින්).	02
		නරඹන්නන් සඳහා සතුන් පිළිබඳ විස්තර කථන වැඩසටහන්.	12
		සත්ව චර්යා වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන්	03
02	ආයතනික පුහුණු වැඩසටහන්	විශ්වවිද්‍යාල සිසුන් සඳහා ආයතනික පුහුණුව.	01
03	සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	2021 වර්ෂය තුළ සේවක සුබසාධනය උදෙසා වැඩසටහන් පවත්වා නැත.	00
04	විශේෂ වැඩසටහන්	සතුන්ගේ සත්ත්ව සුබසාධනය වැඩිදියුණු කරමින් ඉදිවුණු හිපපොටේමස් නව සත්ත්ව අරණ මාධ්‍ය ආයතන 11 ක සහභාගිත්වයෙන් මහජනතාවගේ ප්‍රදර්ශණය සඳහා විවෘත කිරීම.	
		රතු පැහැනි විෂ විදින නාගයා ඇතුළු පිඹුරන් විශේෂ 05ක් මාධ්‍ය ආයතන 3ක් කැඳවා මහජනතාව වෙත හඳුන්වා දීම.	
		හංස පැටවුන් 05 දෙනෙකුගේ උපත මාධ්‍ය ආයතන 04 ක සහභාගිත්වයෙන් රටටම හඳුන්වා දීමේ වැඩසටහන සිදු කිරීම.	
		ක්ෂීරපායි සත්ත්ව විශේෂ 05 ක සතුන්ගේ අළුත උපන් පැටවුන් සඳහා නම් තැබීමේ උත්සවයක් නත්තල් දින සංවිධානය කර එය මාධ්‍ය ආයතන 14ක සහභාගිත්වයෙන් මහජනතාව වෙත හඳුන්වා දීම.	

මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

සටහන : වගු සටහන 1.13 මගින් පෙන්වා දෙන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන් කෝවිඩ් වසංගත තත්ත්වය මත අපේක්ෂා කළ අයුරින් සිදු කර ගැනීමට නොහැකි විය.

දෙහිවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

නවීන සත්වෝද්‍යාන සංකල්ප වලට අනුව සත්ත්වයින් සඳහා වැඩි ඉඩකඩ සහිත සත්ත්ව අරණ සහ නරඹන්නන් සඳහා නවීන පහසුකම් සපයමින් 2010 වර්ෂයේ සිට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ නවීකරණ කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව, 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- සත්ත්ව රෝහල නිර්මාණය සහ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- හිපෝ අරණ නැවත ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- හිපෝ අරණෙහි අප ජලය පිරිපහදු ඒකකය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- සතුන් සඳහා ආහාර පිසින මුළුතැන්ගෙය ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- සිංහ අරණ අළුත්වැඩියා කටයුතු 50%ක් දක්වා අවසන් කර ඇත.

- මැකෝ ගිරවුන් සඳහා අරණ ඉදිකිරීම 40%ක් දක්වා අවසන් කර ඇත.
- මුව අරණ අළුත්වැඩියා කටයුතු 15%ක් දක්වා අවසන් කර ඇත.
- ගෝනපොළ ගොවිපොලෙහි ඉදිකරන සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් 85%ක් දක්වා අවසන් කර ඇත (කබල්ලෑවා, උණහපුළුවා, කොළ දිවියා යන සතුන් සංරක්ෂණය කිරීම සඳහා).

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- ගෝනපොළ ගොවිපොලෙහි කුඩා පරිමාණ සංවර්ධන කටයුතු අවසන් කර ඇත.
- ප්‍රවේශ පෙදෙසෙහි භූමි අලංකරණය සහ වැසිකිළි පද්ධතියෙහි ඉදිකිරීම් අවසන් කර ඇත.

රූපය 1.1 - හිපෝ අරණ



රූපය 1.2 - හිපෝ අරණෙහි අප ජලය පිරිපහදු ඒකකය



රූපය 1.3 - මුළුතැන්ගෙය



රූපය 1.4 - සත්ත්ව රෝහල



රූපය 1.5 - සිංහ අරණ අළුත්වැඩියා කටයුතු



රූපය 1.6 - මැකෝ ගිරවුන් සඳහා අරණ



මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

1.6.2 පින්නවල අලි අනාථාගාරය

වර්ෂ 1975.02.16 වැනි දින අක්කර විසි පහක බිම් කඩක් තුළ කුමාරි, මාතලි, විජය, කදිරා සහ නීලා යන කුඩා අලි පැටවුන් පස් දෙනෙකුගෙන් ආරම්භ කරන ලද පින්නවල අලි අනාථාගාරය මේ වන විට සිය ගමන් මගේ 46 වන වර්ෂය පසු කරමින් සිටියි.

ආරම්භයේ දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු විෂය පථය යටතේ ක්‍රියාත්මක වී ඇති අලි අනාථාගාරය වර්ෂ 1982 දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතට ඇතුළත් කර ඇත. අලි ඇතුන් සංරක්ෂණය හා අභිජනනය මුඛ්‍ය අරමුණ ලෙස සලකමින් මෙය ආරම්භ කළ ද මේ වන විට සත්ත්ව සුභසාධනය, අභිජනනය, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපන හා පර්යේෂණ කාර්යය හා විනෝදාස්වාදය යන පුළුල් අරමුණු තෙක් වර්ධනය වී කාර්ය භාරය පුළුල් වී ඇත.

පින්නවල අලි අනාථාගාරය ආසියානු අලි ඇතුන් සංරක්ෂණ කිරීමේ හා අභිජනන මධ්‍යස්ථානයක් ලෙසින් ලොව ප්‍රමුඛව කටයුතු කරන ස්ථානයක් වන අතර, ආසියානු අලි ඇතුන් විශාල අලි රංචුවක් ලෙසින් එකවර ලොව දැකිය හැකි එකම ස්ථාන ලෙසින් ද දෙස් විදෙස් සංචාරකයින් අතර ප්‍රචලිතය.

ස්වාභාවික පරිසරයට ආසන්න පරිසරයක් තුළ දිවිගෙවන පින්නවල අලි ඇතුන් අතුරෙන් විජය නම් අලි පියාටත් කුමාරි නම් අලි මවටත් දාව 1984 වර්ෂයේ දී උපත ලබන ලද සුකුමලී නම් අලි පැටවා මෙහි පළමු අලි උපත ලෙස වාර්තා වන අතර, එතැන් පටන් මේ වන විට ස්වාභාවික අලි උපත් 73 සිදු වෙමින් සාර්ථක සත්ත්ව අභිජනන ක්‍රියාවලියක් අඛණ්ඩව සිදු කරගනිමින් පවතී. තවද, මෙම වර්ෂය තුළදී සත්ත්ව අභිජනනය සම්බන්ධව ඉතාමත් සුවිශේෂී සිදුවීමක් ලෙස පින්නවල අලි අනාථාගාරයේ ප්‍රථම නිවුන් අලි උපත සිදු විය. එම නිවුන් පිරිමි අලි පැටවුන් සජ්ජන සහ දිසා ලෙස නම්කැබීමක් සිදු කර ලදී.

වගු සටහන 1.14
2021.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	76
එකතුව		**01**	**76**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාර

වගු සටහන 1.15
2021.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	03

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 1.16
2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	අධ්‍යාපනික වැඩසටහන් වර්ගය	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	දේශන හා ප්‍රායෝගික වැඩමුළු	විශ්ව විද්‍යාල ව්‍යාපෘති සඳහා සිසුන් දැනුවත් කිරීම්.	02
02	සේවක සුබ සාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	2021 වර්ෂය තුළ සේවක සුබසාධනය උදෙසා වැඩ සටහන් පවත්වා නොමැත.	00

03	විශේෂාංග සහ විශේෂිත දින සැමරුම්.	• 2021 පෙබරවාර් 16 වන දින පින්නවල අලි අනාථාගාරයේ 46 වන සාංවත්සරික දිනය වෙනුවෙන් "කුංචනාදය 2021" නමින් විශේෂිත උත්සවයක් පැවැත්වූ අතර, එයට සමගාමීව අලි ඇතුන්ට කොල අතු, පළතුරු සහ පෝෂණීය කිරිබත් දානයක් ලබා දෙන ලදී. • අලුත් අවුරුදු හිස තෙල් ගෑමේ උත්සවය. • නත්තල් දින සැමරුම.
04	පුහුණු වැඩසටහන්	2021 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් නොමැත.

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන **1.17**
2021.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2021 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	130.0	62.61	48
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	16.0	0	0
එකතුව	**146.0**	**62.61**	**43**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

සටහන : වගු සටහන 1.16 මගින් පෙන්වා දෙන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන් කෝවිඩ් වසංගත තත්ත්වය මත අපේක්ෂා කළ අයුරින් සිදු කර ගැනීමට නොහැකි විය.

පින්නවල අලි අනාථාගාරයේ භෞතික ප්‍රගතිය

2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු 80% ක් දක්වා නිමකර ඇත.
- නව අලිමඩු ඉදිකිරීම් 65% ක් දක්වා නිමකර ඇත.
- දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් 50%ක් දක්වා අවසන් කර ඇත.
- හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැටෙහි ඉදිකිරීම් ආරම්භකර ඇත.
- බොරළු මාර්ගය සහ භූමි අලංකරණ අළුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර ඇත.
- ප්‍රවේශ ගොඩනැගිල්ලේ වහලය සහ අනෙකුත් අළුත්වැඩියා කටයුතු 85% දක්වා අවසන්කර ඇත.
- පවතින වැව පුළුල් කිරීමෙහි වැඩකටයුතු අවසන් කර ඇත.

රූපය 1.7 - නව අලිමඩු ඉදිකිරීම්



රූපය 1.8 - නරඹන්නන් සඳහා වූ වැසිකිළි



රූපය 1.9 - හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැට



රූපය 1.10 - විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු



රූපය 1.11 - ප්‍රවේශ ගොඩනැගිල්ලේ වහලය සහ අනෙකුත් අළුත්වැඩියා කටයුතු





මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාර

1.6.3 පින්නවල සත්වෝද්‍යානය

ශ්‍රී ලංකාවේ ප්‍රථම එළිමහන් සත්වෝද්‍යානය ලෙස අක්කර 36 කින් යුක්තව පින්නවල සත්වෝද්‍යානයෙහි ප්‍රථම අදියර 2015 අප්‍රේල් මස 17 වන දින දෙස් විදෙස් සංචාරකයින් සඳහා ප්‍රදර්ශනයට විවෘත කරන ලදී. නවීන සත්වෝද්‍යාන සංකල්පයන්ට අනුකූලවෙමින් සත්ත්ව සුභසාධනය ප්‍රමුඛ කරගත්, සංචාරකයින් සඳහා සුන්දර මතක සටහන් ඒකරාශී කර ගත හැකි තෝතැන්නක් ලෙසත් පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින් ආකර්ෂණය කරගනු ලබන හා අධ්‍යාපනික පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙසත් හඳුන්වා දිය හැකි ය.

මෙම සත්වෝද්‍යානය ස්වභාවික පරිසර තත්ත්වයට ආසන්න අයුරින් ශ්‍රී ලංකා දිවි අරණ, මිශ්‍ර මුව අරණ, වලස් අරණ, කිඹුල් අරණ යන සත්ත්ව අරණවල් ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රදර්ශනය සඳහා විවෘතව පවතී. ලංකාවටම ආවේණික උප විශේෂයක් වන ශ්‍රී ලංකාවේ දිවියන්ගේ (කොටියා) ආසන්නයටම ගොස් ඔවුන්ටම ආවේණික වූ සුවිශේෂී චර්යාවන් නැරඹීමට හැකි වන ලෙස දිවි අරණ නිර්මාණය කර ඇත.

සත්වෝද්‍යානයේ මිය යන විශේෂ වටිනාකමක් සහිත සතුන් සංරක්ෂණය කරමින් පින්නවල සත්වෝද්‍යානයේ කෞතුකාගාරය 2022 ජනවාරි මස 11 වන දින නරඹන්නන් වෙනුවෙන් විවෘත කරන ලදී.

වගු සටහන 1.18
2021.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	14	152
2	පක්ෂි	8	49
3	උරග	3	8
	එකතුව	**25**	**209**

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

වගු සටහන 1.19
2021.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	5	23
	එකතුව	**5**	**23**

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

වගු සටහන 1.20
2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	අධ්‍යාපනික වැඩසටහන් වර්ගය	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	දේශන හා ප්‍රායෝගික වැඩමුළු	-	-
02	සේවක පුහුණු වැඩසටහන්	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් සිදුකරන ලද පුහුණු වැඩසටහන.	01
03	විශේෂාංග සහ විශේෂ දින සැමරුම්	2021 දෙසැම්බර් මාසය පාදක කොටගනිමින් නත්තල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	

මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

වගු සටහන 1.21
2021.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මී)	2021 සඳහා සත්‍ය වියදම(රු.මී)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	150.00	30.10	20
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	05.00	3.59	72
එකතුව	**155.00**	**33.69**	**22**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පින්නවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ වැසි වතුර බැස යාමේ පද්ධතියේ සහ අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතියේ ඉදිකිරීම් 70% අවසන් කර ඇත.
- කබල්ලෑවා සඳහා වූ අරණෙහි ඉදිකිරීම් 50% අවසන් කර ඇත.
- වඳුරු දූපත අදියර - III හි ඉදිකිරීම් අවසන් කර ඇත.
- මෝදරවත්ත රථගාල ඉදිකිරීම් කටයුතු 65%ක් අවසන් කර ඇත. .
- නරඹන්නන් සඳහා වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් 60%ක් දක්වා ඉදිකිරීම් අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු සිදු කර ඇත.

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- නිදහස් කුරුළු අරණ පෙදෙසෙහි වේන් ලින් සහ විදුලි වැට ඉදිකිරීම් අවසන් කර ඇත.
- ප්‍රවේශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු (water proofing work) 90% අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරමින් පවතී.

රූපය 1.12 - අභ්‍යන්තර මාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීම




රූපය 1.13 - කබල්ලෑවා සඳහා වූ අරණ



රූපය 1.14 - වඳුරු දූපත අදියර - III





රූපය 1.15 - නිදහස් කුරුළු අරණ පෙදෙසෙහි වේන් ලින් සහ විදුලි වැට





මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

1.6.4 රිදියගම සෆාරි උද්‍යානය

නව සත්වෝද්‍යාන සංකල්ප මත අක්කර 500ක භූමි ප්‍රමාණයක ඉදිකෙරෙන සෆාරි උද්‍යානය ප්‍රථම අදියර 2016 මාර්තු 28 දින ආරම්භ විය. දැනට අක්කර 250 ක් පමණ සංවර්ධන කටයුතු සිදු කර ඇති අතර, ඉන් සිංහ කලාපය, ලෝක ශාක භක්ෂක සත්ත්ව කලාපය හා ආසියානු අලි ඇතුන් සිටින කලාපය ප්‍රථම අදියර තුළින් මහජනයාට විවෘත විය. බෙංගාල ව්‍යාඝ්‍ර කලාපය මේ වන විට ප්‍රදර්ශන කටයුතු සඳහා විවෘත කර ඇත. ඉදි කෙරෙමින් පවතින සත්ත්ව කලාප අතර ශ්‍රී ලංකා දිවි කලාපය, ඕස්ට්‍රේලියානු කලාපය, වීටා සතුන් සහිත කලාපය යන සත්ත්ව කලාප වේ.

තවද පක්ෂීන්, කුඩා මාංශ භක්ෂක සතුන්, වානර විශේෂ, කුඩා ශාක භක්ෂකයින් සහ සමනළ උයනක් සහිත අක්කර 35ක භූමි ප්‍රමාණයකින් යුතු කුඩා සෆාරි උද්‍යානයක් ඉදිවෙමින් පවතින අතර, අක්කර 10ක භූමි ප්‍රමාණයකින් යුතු උරග උයනක් ඉදිකිරීමට යෝජිත ය. තවද, අක්කර 10ක භූමි ප්‍රමාණයකින් යුතු සත්ත්ව සංරක්ෂණය සඳහා ම වෙන් වූ සත්ත්ව අභිජනන සහ සංරක්ෂණ මධ්‍යස්ථානයක් ද ඉදි වෙමින් පවතී.

අභිජනනය සංරක්ෂණය කිරීම මඟින් තර්ජනයට ලක්වූ සත්ව විශේෂ වල අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම, සත්ත්ව සංරක්ෂණය පිළිබඳව අධ්‍යාපන සහ පර්යේෂණ අවස්ථා ඇතිකරලීම, ශ්‍රී ලාංකිකයින්ට සෆාරි සංචාරක අත්දැකීමක් ලබා දෙමින් විනෝදාස්වාදය ලබාදීම සහ පාරිසරික සංචරණය ප්‍රවර්ධනයට දායකවීම මගින් රටේ ආර්ථික සංවර්ධනයට දායක වීම මෙමෙ ව්‍යාපෘතියේ මූලික අභිමතාර්ථ වේ.

වගු සටහන 1.22
2021.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	34	396
2	පක්ෂි	33	176
3	උරග	02	346
	එකතුව	**69**	**918**

මූලාශ්‍රය : හම්බන්තොට සෆාරි උද්‍යානය

වගු සටහන 1.23
2021.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	15	31
2	පක්ෂි	32	63
	එකතුව	**47**	**94**

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

වගු සටහන 1.24
2021.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	**2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මී)**	**2021 සඳහා සත්‍ය වියදම(රු.මී)**	**මූල්‍ය ප්‍රගතිය %**
රජයේ ඒකාබද්ධ අරමුදල	112.00	95.40	85
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	25.00	7.15	29
එකතුව	**137.00**	**102.55**	**75**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.25 2021 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්			
අනු අංකය	**අධ්‍යාපනික වැඩසටහන් වර්ගය**	**ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම**	**ක්‍රියාකාරකම් ප්‍රමාණය**
01	දේශන හා ප්‍රායෝගික වැඩමුළු	පවතින කොවිඩ් 19 තත්ත්වය මත අදාළ ක්‍රියාකාරකම් සිදු කර නොමැත.	-
02	සේවක පුහුණු වැඩසටහන්	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් සිදු කරන ලද පුහුණු වැඩසටහන.	01
03	විශේෂාංග සහ විශේෂ දින සැමරුම්	2021 දෙසැම්බර් මාසය පාදක කොටගනිමින් නත්තල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	
04	පර්යේෂණ	පවතින කොවිඩ් 19 තත්ත්වය මත අදාළ ක්‍රියාකාරකම් සිදු කර නොමැත.	-

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

සටහන : වගු සටහන 1.25 මගින් පෙන්වා දෙන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන් කෝවිඩ් වසංගත තත්ත්වය මත අපේක්ෂා කළ අයුරින් සිදු කර ගැනීමට නොහැකි විය.

රිදියගම සෆාරි උද්‍යානය භෞතික ප්‍රගතිය

2021 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- කුඩා සෆාරි උද්‍යානයේ
  - සේවා සපයන මාර්ගය 50%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර ඇත.
  - සුරතල් සත්ත්ව කලාපයේ ඉදිකිරීම් අවසන් කර ඇත.
- විදේශීය කුරුළු උයන ඉදිකිරීම් 75%ක් වැඩ අවසන් කර ඇත.
- වීටා කලාපය
  - වීටා සඳහා ගුහා හා රැඳවුම් පෙදෙස 40%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර ඇත.
- ආසියානු අලි කලාපය සහ විටා කලාපය අතර අඩි 16 උස වේන් ලින්ක් වැට 55%ක් වැඩ අවසන් කර ඇත.
- සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ වැඩ අවසන් කර ඇත.
- ආසියානු කලාපය
  - රුක් නිවාස (Tree Huts) 35%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර ඇත.
  - බොරළු පාර - ආසියානු අලි කලාපය 50%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සිවිල් ආරක්ෂක බලකා දෙපාර්තමේන්තුව විසින් නිම කිරීමට නියමිතය.
- ඕස්ට්‍රේලියානු කලාපය
  - නොගැඹුරු පොකුණෙහි වැඩ අවසන් කර ඇත.
- අලින් 06 දෙනෙකු සඳහා වූ අරණෙහි ඉදිකිරීම් අවසන් කර ඇත.
- නිල නිවාස සහ සේවා කලාපය සඳහා සේවා සපයන මාර්ගය සහ විදුලිය සැපයුම අදියර - II ඉදිකිරීම් අවසන් කර ඇත.

සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- විටා කලාපයෙහි අඩි 16 උස චේන් ලින්ක් වැට සහ පිටවීමේ දොරටුවේ ඉතිරි වැඩ 35%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සිවිල් ආරක්ෂක බලකා දෙපාර්තමේන්තුව විසින් නිම කිරීමට නියමිතය.
- අප්‍රිකානු අලි අරණ 50%ක් වැඩ අවසන් කර ඇත. ඉදිරි කටයුතු සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර ඇත.
- සිංහ ගුහාව - අංක 03, 80%ක් වැඩ අවසන් කර ඇත.

රූපය 1.16 - අලින් 06 දෙනෙකු සඳහා වූ අරණ



රූපය 1.17 - විදේශීය කුරුළු උයන



රූපය 1.18 - සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය



රූපය 1.19 - සූරතල් සත්ත්ව කලාපය



රූපය 1.20 - ආසියානු අලි කලාපය සහ විටා කලාපය අතර අඩි 16 උස චේන් ලින්ක් වැට



රූපය 1.21 - සිංහ ගුහාව - අංක 03



මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

1.6.5 ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ

දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාකභක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාරවලින් කොටසක් සැපයීම පිණිස මෙම ගොවිපළ 1997 වර්ෂයේ දී හොරණ - ගෝනපොල ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුළ ස්ථාපිත කරන ලදී. මේ වන විට හම්බන්තොට සෆාරි උද්‍යානය, පින්නවල අලි අනාථාගාරය වෙතද අවශ්‍යතාවය මත තණකොළ හා තැඹිලි වැනි ද්‍රව්‍ය සැපයීම සිදුකරනු ලබයි.

2021 වර්ෂය තුළ දෙහිවල සත්වෝද්‍යානය වෙත සපයන ලද සත්ත්ව ආහාර ප්‍රමාණය, අතිරික්ත සතුන් හා අතිරික්ත බෝග අලෙවි කිරීමෙන් ලද ආදායම ඇතුළුව 2021 වසර තුළ රු.මි. 5.9 ක පමණ සමස්ත ආදායමක් ලබා ඇත. වර්තමානයේ ගෝනපොල ගොවිපල සත්වෝද්‍යානය සඳහා Co4 තණකොළ, තැඹිලි සහ උක් සඳහා ඇති සම්පූර්ණ ඉල්ලුම සපුරාලයි.

ගෝනපොල ගොවිපළ සත්වෝද්‍යාන අරමුණු සඳහා වඩාත් ඵලදායී ලෙස දායක කර ගනිමින් ගෝනපොල ගොවිපළ පරිශ්‍රය තුළ දෙහිවල සත්වෝද්‍යානයේ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමට කටයුතු කර ඇත. එහි ඉදිකිරීම් මේ වන විට අවසන් අදියරේ පවතී.

වගු සටහන 1.26
2021.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	1	2
2	පක්ෂි	7	24
3	උරග	1	113
	එකතුව	**9**	**139**

මූලාශ්‍රය : ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ

වගු සටහන 1.27
2021.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	1	1
2	පක්ෂි	1	1
	එකතුව	**2**	**2**

මූලාශ්‍රය : ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ





1.7 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1.7.1 රජයේ ඒකාබද්ධ අරමුදල

2021 වර්ෂය අවසන් වන විට රජයේ ඒකාබද්ධ අරමුදලින් දරණ ලද වියදම රු. 820,143,876ක් වන අතර ප්‍රාග්ධන වියදම රු. 293,798,191ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු. 526,344,685ක් ලෙස උපයෝජනය කොට ඇත.

වගු සටහන 1.28 : වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

(රු.000)

ධාරා අංකය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2020		2021	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	පුනරාවර්තන වියදම	**528,930**	**518,851**	**566,000**	**526,345**
	පුද්ගල වේතන	**456,418**	**447,645**	**479,000**	**443,190**
1001	වැටුප් සහ වේතන	266,769	262,999	280,000	259,969
1002	අතිකාල හා නිවාඩු දින ගෙවීම්	91,060	88,115	95,000	90,413
1003	වෙනත් දීමනා	98,589	96,531	104,000	92,808
	ගමන් වියදම්	**1,892**	**1,516**	**2,200**	**1,879**
1101	දේශීය	1,892	1,516	2,200	1,879
1102	විදේශීය	0	0	0	0
